# Remarkable Continuous Achievement by the Team of Treasury Operations for the Financial year 2016 and 2017

## Excerpt from the newspapers

■ වර්ෂ 2019 ක්‍රිවූ අගෝස්තු මස 14 වැනිදා බදාදා

දිනමිණ

පිටුව 05

# රාජ්‍ය මූල්‍ය හා ගිණුම් කළමනාකරණය ඇගැයීමෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේ දී පළමු තැනට



භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්. එම්. ඒ. රත්නායක මහතාට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රථම ස්ථානය සඳහා වූ සම්මානය ප්‍රදානය කරන අයුරු.

පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව සිදු කරනු ලබන රාජ්‍ය මූල්‍ය ගිණුම් කළමනා-කරණය සම්බන්ධ ඇගයීමෙන් දෙවන වරටත් 2017 වර්ෂය සඳහා භාණ්ඩාගාර මෙහෙ-යුම් දෙපාර්තමේන්තුවට ප්‍රථම ස්ථානය හිමිව ඇත. මීට අදාළ සම්මානය පසුගිය ද එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්. එම්. ඒ. රත්නායක මහතා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් ලබා ගත්තේය.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2017 මුදල් වර්ෂයේ ගිණුම් පද-නම් කරගෙන මූල්‍ය හා කාර්ය සාධන නියමයන් සහ අනුගතවීම් පිළිබඳ සිදු කළ ඇගයීම් සටහන අනුව කාණ්ඩ 10ක් යටතේ කාර්ය සාධන පෙන් වූ ආයතන තෝරා පසුගිය ද ජනාධිපති-වරයා විසින් සම්මාන සහතික පත් ප්‍රදානය කරන ලදී. රාජ්‍ය ආයතන 8ක් ඇගයීමට භාජනය කරන ලද අතර එයින් ආයතන 109ක් සම්මානයට පාත්‍ර විය. ඒ අතරින් 'රජයේ දෙපාර්තමේන්තු කාණ්ඩය' යටතේ ඇගයීමට ලක් වූ භාණ්ඩාගාර මෙහෙ-යුම් දෙපාර්තමේන්තුව 100%ක ඉහළම කාර්ය සාධනයක් වාර්තා කරමින් දිවයිනේ පළමු ස්ථානය මෙවර ද හිමි කර ගන්නා ලදී. එබැවින් 2016 සහ 2017 වසර දෙක සඳහාම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මේ සම්මානය හිමි කර ගැනීම සුවිශේෂී අවස්ථාවකි.

# Remarkable Continuous Achievement by the Team of Treasury Operations for the Financial year 2016 and 2017

## Excerpt from the newspapers

2019 අගෝස්තු 08 බ්‍රහස්පතින්දා අරුණ 15

### රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ඇගැයීමේ
# පළමු තැන දෙවැනි වරටත් මහා භාණ්ඩාගාරයට



පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව විසින් සිදු කරනු ලබන රාජ්‍ය මූල්‍ය ගිණුම් කළමනාකරණය සම්බන්ධ ඇගයීමෙන් දෙවන වරටත් 2017 වර්ෂය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රථම ස්ථානය හිමිව ඇත. මීට අදාල සම්මානය පසුගියදා එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්. එම්. ඒ. රත්නායක ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් ලබා ගත්තේය.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2017 මුදල් වර්ෂයේ ගිණුම් පදනම් කරගෙන මූල්‍ය හා කාර්ය සාධන නියමයන් හා අනුගතවීම් පිළිබඳ සිදු කළ ඇගයීම් සටහන අනුව කාණ්ඩ 10ක් යටතේ කාර්ය සාධනයන් පෙන්වූ ආයතන තෝරා පසුගියදා ජනාධිපතිවරයා විසින් සම්මාන සහතික පත් ප්‍රදානය කරන ලදී. රාජ්‍ය ආයතන 8ක් ඇගයීමට භාජනය කරන ලද අතර, එයින් ආයතන 109ක් සම්මානයට පාත්‍ර විය. ඒ අතුරින් "රජයේ දෙපාර්තමේන්තු කාණ්ඩය" යටතේ ඇගයීමට ලක් වූ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 100%ක ඉහළම කාර්ය සාධනයක් වාර්තා කරමින් දිවයිනේ පළමු ස්ථානය මෙවර ද හිමි කර ගන්නා ලදී.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති සම්මාන ප්‍රදානෝත්සවයේ දී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්. එම්. ඒ. රත්නායක මහතා වෙත ජනාධිපතිවරයා විසින් ප්‍රථම ස්ථානය සඳහා වූ සම්මානය ප්‍රදානය කරන අයුරු ඡායාරූපයේ දැක්වේ.

# Remarkable Continuous Achievement by the Team of Treasury Operations for the Financial year 2016 and 2017

**Excerpt from the newspapers**

රිවි

කොළඹ

## රාජ්‍ය මූල්‍ය හා ගිණුම් කළමනාකරණය ඇගැයීමෙන් පළමු තැන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට



පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව විසින් සිදු කරනු ලබන රාජ්‍ය මූල්‍ය ගිණුම් කළමනාකරණය සම්බන්ධ ඇගයීමෙන් දෙවන වරටත් 2017 වර්ෂය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රථම ස්ථානය හිමිව ඇත. මීට අදාළ සම්මානය පසුගියදා එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්.එම්.ඒ. රත්නායක මහතා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් ලබා ගත්තේය.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2017 මුදල් වර්ෂයේ ගිණුම් පදනම් කරගෙන මූල්‍ය හා කාර්ය සාධන නියමයන් හා අනුගතවීම් පිළිබඳ සිදු කළ ඇගයීම් සටහන අනුව කාණ්ඩ 10ක් යටතේ කාර්ය සාධනයන් පෙන්වූ ආයතන තෝරා පසුගියදා ජනාධිපතිවරයා විසින් සම්මාන සහතික පත් ප්‍රදානය කරන ලදී.

"රජයේ දෙපාර්තමේන්තු කාණ්ඩය" යටතේ ඇගයීමට ලක් වූ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 100%ක ඉහළම කාර්ය සාධනයක් වාර්තා කරමින් 2016 හා 2017 යන වසර දෙක සඳහාම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මෙම සම්මානය හිමිකර ගැනීම සුවිශේෂී අවස්ථාවකි.